## ආයතනයේ ඉතිහාසය

දැනට වසර 75ක විපුල උරුමයකට හිමිකම් කියන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 1949 දී කොළඹ 7 හෝර්ටන් පෙදෙසේ පිහිටි දර්ශනීය හේවුඩ් ගොඩනැගිල්ලෙහි පිහිටුවනු ලැබී ය. ඉන් පෙර එය පැවතුණේ මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ චිත්‍ර කර්ම අංශය ලෙස ය. 1800 ගණන්වල අගභාගයේ දී පිහිටුවනු ලැබූ මෙම ආයතනය, දේශීය චිත්‍රශිල්පීන්ට චිත්‍ර ඇඳීමේ බටහිර සාම්ප්‍රදායන් සහ ශෛලීන් හඳුන්වාදෙමින් ඔවුන්ගේ ශාස්ත්‍රාලීය නිර්මාණාත්මක පසුබිම වඩාත් ශක්තිමත් කිරීමට හේතු විය.

1949 දී යටත් විජිත පාලනයෙන් ශ්‍රී ලංකාව නිදහස ලැබීමත් සමග, රජයේ ලලිත කලායතනය නමින් නැවත නම් කෙරුණු මෙම ආයතනයේ පළමු විදුහල්පති වූයේ ජේ. ඩී. ඒ. පෙරේරා ය. ඔහුගේ භාරකාරත්වය යටතේ ප්‍රධාන පෙළේ සෞන්දර්යාත්මක භාවිතයන් ලෙස සංගීතය සහ ප්‍රසාංගික කලා විෂයමාලාවට ඇතුළත් කෙරිණි. විදුහල්පති ධූරය ඉන්පසු ඩේවිඩ් පේන්ටර් සහ ස්ටැන්ලි අබේසිංහ අතට පත් වූ අතර, තිස්ස රණසිංහ, එස්. පී. චාල්ස්, ඩබ්ලිව්. ඒ. ආරියසේන ඇතුළු බොහෝ දෙනා ආයතනයේ ශික්ෂණවේදී පසුබිම සැකසුවෝ ය.

අද වන විට ශ්‍රී ලංකාවේ කීර්තිමත් කලාකරුවන් බොහෝ දෙනෙකු පුහුණු කොට ඇති සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අතිශය වැදගත් ආයතනයක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වෙයි. එහි විපුල උරුමය, දශක ගණනාවක් පුරා සමාජ, සංස්කෘතික සහ දේශපාලන පරිසරයන් සමඟ ගනුදෙනු කරමින්, නව්‍යත්වය වැළඳගත් වෘත්තිකයින් අතින් හැඩගැසී ඇත.

PIVOT GLIDE ECHO

***Pivot Glide Echo* /** අක්ෂය ප්‍රසර්ජනය ප්‍රතිරාවය

අභිරක්ෂණය : මරියම් බේගම්

10 පෙබරවාරි - 10 පෙබරවාරි 2025

***Pivot Glide Echo*** ප්‍රදර්ශනයේ පළමු පෙළගැස්මේ සිට වත්මන් දෙවන අදියර දක්වා පෙරට යාමේ දී ශ්‍රී ලංකා කලා ඉතිහාසය හැඩගස්වන කලාත්මක පරිකල්පනයේ විවිධ ධාරාවන් ගවේෂණය කිරීමේ අභිලාෂයක් බවට පරිවර්තනය වෙයි. 2024 වසරේ දී එය දශක අටක් යා කරන පරම්පරාන්තර සංවාදයක් ලෙස දිගහැරුණේ ලයනල් වෙන්ඩ්ට් එහි උත්ප්‍රේරකය ලෙස ගනිමිනි. ඊට සමාන ආකල්පයකින් යුතුව, මෙවර ප්‍රදර්ශනය පර්යේෂණාත්මක රූප නිර්මාණය සමග ගනුදෙනුව පුළුල් කරයි. ඒ අතර දෘශ්‍ය කලා ඉතිහාසය තුළ නිර්මාණ බිහිවීමේ මොහොත, ඒවාට අයත් සංස්කෘතික සහ සමාජ-දේශපාලන පසුබිම තුළ පිහිටුවනු ලැබේ. කොළඹ පිහිටි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය කේන්ද්‍ර කරගන්නා මේ ප්‍රදර්ශනය, එම ආයතනයෙහි කීර්තිධර විද්වතුන් වන ඩේවිඩ් පේන්ටර් (උ. 1900, අල්මෝරා, වි. 1975, නුවර එළිය), තිස්ස රණසිංහ (උ. 1925, යොගියානා, වි. 2019, ලන්ඩන්) සහ එච්. ඒ. කරුණාරත්න (උ. 1925, කලුතර, නුගේගොඩ පදිංචිව වැඩ කරයි) යන කලාකරුවන්ගේ භාවිතයන් විමර්ශනය කරමින් පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකාවේ දෘශ්‍ය කලාව හැඩගැස්වූ උත්සුකයන් පිළිබඳ කෙටි අන්වේෂණයක යෙදෙයි.

අලුතින් නිදහස ලද රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව නැඟී ඒමත් සමග, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය (ඊට පෙර රජයේ ලලිත කලායතනය) තුළ ඩේවිඩ් පේන්ටර්, ජේ. ඩී. ඒ. පෙරේරා සහ ස්ටැන්ලි අබේසිංහ ආදීහු, අතීතය සහ වර්තමානය සමග තමන්ට පැවති සම්බන්ධතාව සක්‍රියව ගවේෂණය කළෝ ය. දෘශ්‍ය කලාව ස්වෛරීභාවය ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් බවට පත්විය. බොහෝ සෙයින් රූපමය භාවිතයක් වටා ගොඩනැඟී තිබුණු විෂය නිර්දේශය එච්. ඒ. කරුණාරත්නගේ මාර්ගෝපදේශනය යටතේ ශික්ෂණවිද්‍යාත්මක වෙනසකට භාජනය වෙමින් චිත්‍රශිල්පීන්ට වෙනත් ප්‍රකාශන ශෛලීන් හඳුන්වා දෙනු ලැබී ය. මේ වර්ධනයන්ට සමාන්තරව, දෘශ්‍ය කලාව සමාජ ගැටලු ආමන්ත්‍රණය කිරීම, දැනුවත්භාවය ඇති කිරීම හා සංස්කෘතික පරිවර්තනයක් බලගැන්වීම දෙසට පරිණාමය විය.

ස්වයං-නිර්ණය සඳහා සුදුසු භාෂාවක් සොයාගැනීමේ බලවත් අභිලාෂය සහ දිගින් දිගටම ගෝලීයකරණයට ලක් වන ලෝකය සමග බද්ධ වීමේ හදිසි අවශ්‍යතාව අතර මැදි වුණු ශ්‍රී ලංකාවේ දෘශ්‍ය කලා භාවිතය දකුණු ආසියානු කලාපය තුළ ඊට සමාන සංසිද්ධීන් ප්‍රතිරාවය කරයි. ශ්‍රී ලාංකීය චිත්‍ර කලාව පිළිබඳ දැනට පවතින අවබෝධයක් මත පදනම්ව ගොඩනැගෙන මෙම ප්‍රදර්ශනය, දකුණු ආසියානු චිත්‍ර කලා ඉතිහාසය සමග බැඳෙන වඩා පුළුල් සංකථනයක් අවුළුවා ලීමට උත්සාහ කරයි. අපේ සීමාවන් තුළ හිඳිමින්, මේ පොහොසත් ඉතිහාසයේ මතුපිට ස්තරය යන්තම් ස්පර්ශ කරමින් අප මතු කරන කරුණු කාරණා ඔස්සේ වඩාත් පුළුල් සංවාද ඇති කිරීමට පදනමක් සැපයෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

මෙම ප්‍රදර්ශනයෙහි දී ඊනා ද සිල්වා, එච්. ඒ. කරුණාරත්න, ඩේවිඩ් පේන්ටර්, පාල පොතුපිටිය, තිස්ස රණසිංහ, ජගත් රවින්ද්‍ර, තමෝදරම්පිල්ලෙයි ශනාතනන්, චන්ද්‍රගුප්ත තේනුවර, තිලක් සමරවික්‍රම, ප්‍රියන්ත උඩගෙදර, ඩොමිනික් සන්සෝනි, ලකී සේනානායක, සහ ජගත් වීරසිංහගේ කෘති ඉදිරිපත් කෙරේ.

***Pivot Glide Echo*** ප්‍රදර්ශනයේ දෙවන සංස්කරණයට අනුග්‍රාහකත්වය සැපයෙන්නේ රුක්මනී තිස්සනායගම් භාරයෙනි. ඩේවිඩ් පේන්ටර් එකතුව, උදයශාන්ත් ප්‍රනාන්දු, චානක සහ සස්කියා යටවර, පීටර් හැරිස්, නලිනිකා ඔබේසේකර, අල්නාස් සහ අබ්බාස් යුසුෆැලි, අනිකා ප්‍රනාන්දු, නයන්තාරා ෆොන්සේකා, සහ යෙහාලි සහ කුමාර් සංගක්කාරගේ චිත්‍ර එකතුන්වලින් ත්‍යාගශීලීව මේ සඳහා කලාකෘති පිරිනැමිණ. එසේ ම, PRSFG සහ අලුවිහාරේ උරුම මධ්‍යස්ථානයෙන් අපට ලැබුණු දායකත්වය ද මෙහි දී සිහිපත් කරන්නෙමු.

ස්වාත්මය පිළිබඳ හැඟීම ජාතික රාජ්‍යය සමඟ වෙළීගැනීමත් සමඟ අධිරාජ්‍ය පාලනයෙන් මිදී නැඟී එන කලාපවල දෘශ්‍ය භාෂාව සිය ආසන්න පරිසරයෙන් පදනමක් සෙවී ය. භූදර්ශනය රොමැන්තිකකරණය කිරීමේ දීත් සාම්ප්‍රදායිකව යුරෝපීය වූ බයිබල් චරිත කළු සම ඇති පුද්ගලයින් හැටියට යළි පරිකල්පනය කිරීමේ දීත් ඩේවිඩ් පේන්ටර් ස්වයං නිර්ණය උදෙසා වූ අභිලාෂයක් ප්‍රකට කරයි. ඊට සමාන කලාපීය අභිලාෂයක් තුළ මුල් බැස නොතිබුණ ද තිලක් සමරවික්‍රම, රේඛීය ආකෘතිය ත්‍රිමාන ව්‍යුහයක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීම උදෙසා සිංහල අක්ෂරවල වටකුරු ස්වභාවය හා බිතුසිතුවම්වල තරංගාකාර රේඛා මත පදනම් වන්නේ ජන සංස්කෘතිය අගයන කෙළිලොල් නිර්ව්‍යාජත්වයක් ඊට හිමි කර දෙමිනි.

ඊට ප්‍රතිපක්ෂව ප්‍රියන්ත උඩගෙදරගේ නිවර්තන කලාපීය විපුලත්වයෙහි උද්දීප්ත මුහුණුවර, ඇතුළත සැඟවී පවතින ප්‍රචණ්ඩ ඉතිහාසය සහ සමාජ ගැටලු පිළිබඳ ඇඟවුම් කරන බැවින් පාරාදීසයක සුන්දරත්වය පිළිබඳ පුරාණෝක්තියට අභියෝග කරයි. වෙනස් වන භූදර්ශනය පිළිබඳ ඩොමිනික් සන්සෝනිගේ ක්ෂණික නිරීක්ෂණ ඔහුගේ වස්තු විෂය පමණට වඩා දේශපාලනීකරණය නොකරමින් ඔහුගේ කාවයට හසු වූ කල, වීදි ව්‍යවහාරය එහි සක්‍රිය කොටස්කරුවකු බවට පත් වෙයි. ස්වාධිරෝපණ කාර්යයක යෙදෙන පාල පොතුපිටිය ඉවතලිය හැකි එහෙත් බහුලව පවතින අමුද්‍රව්‍ය සිය කෘති තුළට ගෙන එන්නේ සමාජය තුළ හා ලලිත කලා භාවිතය තුළ පවත්නා ධුරාවලි පිළිබඳ විවාදයක් අවුළුවාලනු පිණිස හා එනයින් පවත්නා පර්යාය ඇතුළතින් බිඳ දමනු පිණිස ය.

20 වැනි සියවස අග භාගයෙහි නවීන අදහස් හා තාක්ෂණය එකිනෙක මුණගැසුණු කල්හි, නවෝත්පාදනය සඳහා මාවත් ගණනාවක් විවෘත වූ අතර සෞන්දර්යාත්මක ප්‍රකාශනය පිළිබඳ නිර්වචනය යළි සලකාබැලීමට පෙළඹුමක් ඇති විය. ඔවුන්ගේ සමකාලීනයින් ද සමඟ ඊනා ද සිල්වා හා තිලක් සමරවික්‍රම සැලකුම් ලබන්නේ, සාම්ප්‍රදායික කලා ශිල්පීය භාවිතයන් සඳහා නූතන පරිකල්පනයක් සම්පාදනය කරමින්, කලාව හා සැලසුම් නිර්මාණයට ප්‍රායෝගිකත්වය එකතු කළ කලාකරුවන් ලෙස ය. කාන්තා ප්‍රජාවක් සමඟ වැඩ කළ ඊනා ද සිල්වා අතිශයින් සමකාලීන වූ උසස් ගණයේ ශ්‍රී ලාංකික අනන්‍යතාවක් දෙමින් බතික් කලාව පුනර්ජීවනය කළා ය.

එම ව්‍යාපෘතියෙහි දී ඊනා ද සිල්වාට උදව් කළ සමකාලීනයෙකු වූ ලකී සේනානායක, නිදහස හඹා යමින් විධිමත් පුහුණුව ඉවත දැමී ය; වන සතුන්ගේ රූපවලට මිනිස්-බඳු ලක්ෂණ කවමින් ලෝහයට ජීවය පිඹින්නට සමත් වූ ශ්‍රී ලංකාවේ වඩාත් ම ක්‍රියාකාරී මූර්ති ශිල්පියකු බවට පත් විය. ඔවුන්ට සමාන්තරව එච්. ඒ. කරුණාරත්නට ඇමෙරිකානු වියුක්ත ප්‍රකාශනවාදය මුණගැසීම ශාස්ත්‍රාලීය ආයතනවල කලා ශික්ෂණවේදයෙහි වෙනස්කම්වලට තුඩු දුන්නේ ය. එනයින් රූපමය භාෂාවෙන් පිට පැන අමුද්‍රව්‍ය සමඟ අත්හදාබැලීම් කිරීමේ ඉඩකඩ පුළුල් කළේ ය. කස්මීර් මැලේවිච්ගේ කෘති කෙරෙන් ආවේශය ලබමින්, මුද්‍රණාක්ෂරවේදය හා යාන්ත්‍රික තාක්ෂණය යොදාගෙන රූප නිර්මාණය කිරීමේ හැකියාව ෟපිළිබඳ චන්ද්‍රගුප්ත තේනුවර කළ ගවේෂණයේ ප්‍රතිඵල, දශක දෙකකට පසු පැමිණි ඔහුගේ *Glitch/ග්ලිච්* කෘති මාලාවේ පෙරනිමිත්තක් ලෙස සැලකිය හැකි ය.

1990 ගණන්වල මුල දිගහැරුණු සිවිල් යුද්ධය දෘශ්‍ය කලා ක්ෂේත්‍රය තුළ බලගතු සමාජ-දේශපාලන විවරණයක් අවුළුවාලී ය. එහි බලපෑම සහිතව ගරුත්වය, මතකයන් හා නිවහන අහිමි වීම පිළිබඳ බරපතල හැඟීම තමෝදරම්පිල්ලෙයි ශනාතනන්ගේ භාවිතය තුළ යළියළිත් හමු වන තේමාවන් බවට පත් විය. ප්‍රචණ්ඩත්වය විසින් කලාකරුවන් බහුතරයේ අධිකාරය විචාරාත්මකව පරීක්ෂා කිරීමට පොළඹන ලද අතර සන්තාපය හා වරදකාරී හැඟීම පිළිබඳ ජගත් වීරසිංහගේ ප්‍රකාශනයන්ට මඟ පෑදී ය.

ශනාතනන් හා වීරසිංහ යන දෙදෙනා ගත් ප්‍රවේශය දෘශ්‍ය කලා භාවිතය තුළ වාර්ගික හා භාෂා ගැටලු පිළිබඳ කතිකාව ගත් දිශානතීන් විදහා පායි. සිය යුගයේ සමාජ යථාර්ථයන්ට සංවේදීව ප්‍රතිචාර දැක්වීමට කලාකරුවන් දැක්වූ නැඹුරුව තිස්ස රණසිංහගේ මූර්ති තුළ පැහැදිලිව ම පෙනේ. එහි දී පුරාණෝක්තිමය හා ආගමික විෂයයන් කලාකරුවාගේ විනිවිද යන ධ්‍යානයන් සඳහා රූපකාත්මක පසුබිම සම්පාදනය කරයි. ඊට ප්‍රතිවිරුද්ධ ආඛ්‍යානයක් ඉදිරිපත් කරන ජගත් රවීන්ද්‍රගේ *Blooming Beauty / මල්බර සුන්දරත්වය* නමැති කෘති මාලාව, දේශපාලන කැලඹීම්වලින් සමන්විත වාතාවරණයකට හිතාමතා දක්වන ප්‍රතිචාරයකි.  අනිත් අතට එහි දී ප්‍රචණ්ඩත්වය රජ කෙරුණු භූදර්ශනයක් තුළ සුන්දරත්වය හා සුසංවාදය වර්ණනා කෙරෙයි.